# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்

## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
த.பெ.1559, பொது திறைசேரி, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு , கொழும்பு 01 ,இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Planning and Economic Development, Colombo 01, Sri Lanka

| | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | TO/CFM/01/Miscellaneous | ඔබේ අංකය<br>உமது இல<br>Your | | දිනය<br>திகதி<br>Date | 2026.10. 19 |

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

**ITMIS පද්ධතිය තුළ Payment Extract Payment (PEP) ක්‍රියාවලිය මගින් ගෙවීම් පියවීම**

ITMIS පද්ධතිය තුළ රජයේ ගෙවීම් නිසි පරිදි වාර්තා කිරීම හා මූල්‍ය තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. මෙම දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සඳහා අක්මුදල් නිකුත් කර ඇති වුවද, ඒවාට අදාළ ඇතැම් වවුචර්පත් Integrated Treasury Management Information System (ITMIS) පද්ධතිය තුළ Payment Extract Payment (PEP) ක්‍රියාවලිය මගින් මෙතෙක් පියවා නොමැති බව නිරීක්ෂණය වී ඇත.

03. එබැවින්, මෙම දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් නිකුත් කර ඇති 2026 ඔක්තෝබර් 01 දිනෙන් පසු දිනැති සියලුම වවුචර්පත් සම්බන්ධයෙන් Payment Extract Payment (PEP) ක්‍රියාවලිය කඩිනමින් සම්පූර්ණ කර ගෙවීම් පද්ධතිය තුළ විධිමත්ව පියවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මෙයින් දන්වා සිටිමි.

04. තවද, 2026 ඔක්තෝබර් 07 දින සිට අඛණ්ඩව සතිපතා ITMIS පද්ධතියේ ඇතුළත් කරන ගෙවීම් සඳහා අක්මුදල් නිකුත් කිරීමේදී, Payment Extract Payment (PEP) ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති වවුචර්පත් පවතින ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන අක්මුදල් ඉල්ලීම් සලකා බැලීමේදී එම තත්ත්වය ද සැලකිල්ලට ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.

05. සියලුම රජයේ ගෙවීම් ITMIS පද්ධතිය තුළ නිවැරදිව හා කාලෝචිතව වාර්තා කිරීම සහ පද්ධතියේ මූල්‍ය දත්තවල සම්පූර්ණත්වය හා නිරවද්‍යතාව සහතික කිරීම සඳහා, ඉහත කාර්යය ප්‍රමුඛතාවයක් ලෙස සලකා කඩිනමින් සම්පූර්ණ කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.


**ජී. එම්.එස්. මල්කාන්ති**
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

දුරකථන අංකය : 011-2484729
ෆැක්ස් අංකය : 011-2431498
විද්‍යුත් තැපැල : dgto@tod.treasury.gov.lk

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
**Department of Treasury Operations**

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
த.பெ.1559, பொது திறைசேரி, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு , கொழும்பு 01 ,இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Planning and Economic Development, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: +94 11 2484600, +94 11 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2484970, +94 11 2320042
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | TO/CFM/01/Miscellaneous | ඔබේ අංකය / உமது இல / Your | |
| දිනය / திகதி / Date | 13.10.2026 | | |

All Secretaries of Ministries,
Heads of Departments,
District Secretaries,

**Settlement of Payments through the Payment Extract Payment (PEP) Process in ITMIS**

Your attention is drawn to the importance of properly recording Government payments in the Integrated Treasury Management Information System (ITMIS) and maintaining up-to-date financial information within the system.

02. It has been observed that, although imprests have been released by this Department for the settlement of payments, certain related vouchers have not yet been settled through the Payment Extract Payment (PEP) process in the Integrated Treasury Management Information System (ITMIS).

03. Accordingly, you are hereby informed to take necessary action to expeditiously complete the Payment Extract Payment (PEP) process in respect of all vouchers dated on or after 01 October 2026, for which imprests have been released by this Department, and to ensure that such payments are duly settled within the system.

04. Further, with effect from 07 October 2026, and on a continuous weekly basis thereafter, when considering requests for the release of imprests in respect of payments entered into the ITMIS, due consideration will be given to whether the Payment Extract Payment (PEP) process has been completed. Accordingly, the status of institutions having outstanding vouchers for which the Payment Extract Payment (PEP) process has not been completed will be taken into account when processing such imprest requests.

05. Your prompt attention is requested to treat this matter as a priority and ensure its immediate completion in order to guarantee the accurate and timely recording of all Government payments in the ITMIS and to maintain the completeness and accuracy of the financial data contained therein.


A.M.S. Malkanthi
Director General
Department Of Treasury Operations

Telephone No : 011-2484729
Fax No : 011-2431498
Email : dgto@tod.treasury.gov.lk